# අන්තර්ජාලයෙන් ඔබ්බට

**තාක්ෂණය නැමැති නියමුවා ලේඛකයින්ට, සංගීතඥයින් සහ චිත්‍රපට නිර්මාණකරණයේ නියැලෙන්නන් වැනි කලාකරුවන්හට තම ආත්මතෘප්තිය මුදුන් පමුණුවා ගැනීම උදෙසා මග පෙන්වන්නෙකි. වෙබ් අඩවි නිර්මාණ සංසදය මගින් නවීන තාක්ෂණයේ උපරිමය යොදා නිර්මාණය කළ අපූරු කෙටි චිත්‍රපටිය මේ බව ඔප්පු කර ඇත. "Lions are Green" ලෙස නම්කර ඇති මෙම චිත්‍රපටිය නැරඹීමට ඔබ කැමැත්තෙන් සිටීනම් Sonicbids . Com වෙබ් අඩවියට යා යුතුය. මෙහි සංගීතය නිර්මාණය කර ඇත්තේ විවිධ වෙබ් අඩවිවල සහ ගීත නිර්මාපකයන්ගේ දායකත්වයෙනි.**



මෙහිලා ප්‍රමුඛ දායකත්වය ලැබී ඇත්තේ ඉරඑනවජඥ .බ්ධඨ වෙබ් අඩවියේ කලාකරුවන්ගෙනි. ඔවුන් විසින් නිමවනලද නව සංගීත කණ්ඩායම "Friends" නම් වේ. සම්ප්‍රදායික සංගීත නිර්මාපකයකු වන විඑජඩඹිහඑජධඑජඥ මහතා වෙබ් අඩවි අතර විශේෂයෙන්ම ජනප්‍රිය වී ඇත. එසේම සමාජශාලාවල බහුල වශයෙන් එම නිර්මාණ භාවිතයට ගනු ලබයි.

මෙම කලාවේ වර්ධනය නිසා අද පරිගණක වටා විශාල සංගීත රසික පිරිසක් රොක් වී සිටිති. පරිගණක හරහා නවතම සංගීත අංගයන්, ගීත, රූපරාමු, ලබාගැනීමේ හැකියාව ඇත. ඒ සඳහා ඔබට අවශ්‍ය වන්නේ හොඳ පරිගණකයක් පමණි. Electronic Files නම් වූ නව කලාව මගින් සංගීතයක් හෝ පොත් ප්‍රකාශනයක් වෙබ් අඩවි ඔස්සේ සිදුකළ හැකිය. කිසිදු මුද්‍රණ ගාස්තුවක් නොගෙවා ඕනෑම අයෙකුට කියවා ලබාගත හැකි මෙම විද්‍යුත් පුස්තක Electronic Books අද බෙහෙවින් ජනප්‍රිය වී ඇත. Angela Hoy (ඇන්ජෙලා හෝයි) මෙකී ක්‍රමය භාවිතයන් මසකට ඩොලර් 500 ක ආදායමක් උපයයි. මෑතකදී ඇය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ පොත් පිංච ඇන්ජෙලා නම් කරනු ලැබුවේ "The Emergency Divorce Hand Book For Women" යන නමිනි.

Tools of the Trade වෙළඳමට උපකරණ (ඔබේ හැකියාවන් ඉස්මතු කිරීමට මෘදුකාංගයක්)

වෘත්තීය ලේඛකයකු, චිත්‍රපට නිෂ්පාදකයකු හෝ සංගීතඥයකු වීමට ඔබට අවශ්‍යද? කොතනින් පටන්ගතයුතුදැයි ඔබට සිතාගැනීමට නොහැකි වනු ඇත. නවීන තාක්ෂණය අද ඔබේ පිහිටට ඇත. වෙබ් අඩවි ඔස්සේ ඔබේ හැකියාවන් වර්ධනයට නවතම මෘදුකාංග කිහිපයක් හඳුන්වා දී තිබේ.

MBOX2 මගින් නිවස් සිට පටිගත කිරීම් සිදුකළ හැකි (Home recording system) මෘදුකාංගයක් නිපදවා ඇත. එමගින් විවිධ සංගීත රටා මිශ්‍ර කිරීමටත් සංගීත සංස්කරණ, ශබ්ද පරිපාලනය ආදී දහසකුත් කාර්යයන් කළ හැකිය.





කෙටියෙන්ම පැවසුවහොත් ඔබේ කාමරය ශබ්දගාරයක් බවට එක් මොහොතකින් පත්කළ හැකිය. ඔබට සංගීත ඇල්බමයක් නිකුත් කිරීමට ගතවන්නේ සුළුකාලයකි.

XLIBRIS . Com නම් වෙබ් අඩවි ආයතනය මගින් නවතම පොත් ප්‍රකාශන ආයතනයක් පවත්වාගෙන යයි. ඔබට අවශ්‍ය ඕනෑම පොතක් වෙබ් අඩවි මගින් නැරඹිය හැකිය. පිටපත් මුද්‍රණය වැනි කාර්යයන් ඩොලර් 500 ක මුදලකට ලබාගත හැකිය.

Final cut express මගින් චිත්‍රපට නිෂ්පාදනයට නව අත්වැලක් සපයා ඇත. විශේෂයෙන්ම චිත්‍රපට සංගීතය අවශ්‍ය මෘදුකාංගයක් වන මෙය ඩොලර් 300 ක මිලකට Apple.Com මගින් ලබාගත හැකිය.

කිසිවකු නොසිතන මේ ඩිජිටල් පරිණාමය මගින් කලාවට මෙතරම් අගනා දායකත්වයක් ලබාදීම විශ්මයජනකය. "Catch me if you can" චිත්‍රපටයේ විධායක නිෂ්පාදක ෂේන් මිෂෙල පවසන්නේ මෙය ඇදහිය නොහැකි විපර්යාසයක් බවය. නමුත් මෙය එක්දිනකින් සිදුවූවක් නොව වේදිකාවේ සිට විශාල තිර චිත්‍රපට බිහිවීම දක්වා තාක්ෂණයේ සිදුවූ විපර්යාසයේ ප්‍රතිඵලයකි. දැන් සංගීතයේ නිම්වළලු පුළුල් වී ඇති බව පවසන ප්‍රසිද්ධ සංගීතඥ පීටර් ස්පෙල්මන් අතිශය ජනප්‍රියත්වයට පත්වූ "The Self Promoting Musician" නම් තම වැඩසටහන ප්‍රචාරය කිරීමට භාවිත කළේ Mucidish.com වෙබ් අඩවියයි. ලොව බොහෝ ගීත රචකයන්, සංගීතඥයන්, තනු නිර්මාපකයින් තම දක්ෂතා හා හැකියාවන් කලඑලි දක්වන්නට තෝරාගන්නා එකම මාධ්‍ය බවට වෙබ් අඩවි සමත් වී ඇත. එසේම Online සංගම් මගින් අද තරුණ තරුණියන් වසඟයට පත්කාටගෙන ඇත. ඔවුන් විවිධ වූ කලා අංග, පොත් පත්, චිත්‍රපට එකිනෙකා අතර (E-mail) විද්‍යුත් තැපැලෙන් හුවමාරු කරගනිමින් තම දැනුම වර්ධනය කරගනිමින් සිටිති.

වර්තමානයේ රූපවාහිනියෙන් චිත්‍රපට නැරඹීමේ කලාව ඉවත්වී ඇත. ඇමෙරිකාවේ හිටපු උප ජනාධිපති අල්ගෝර් (Al Gore) මහතා විසින් දියත් කළ කේබල් ප්‍රවෘත්ති ජාලය (Cable News Network) මගින් රූපවාහිනී ප්‍රවෘත්ති හා චිත්‍රපට නැරඹීම ආරම්භ විය. මෙය අන්තර්ජාලයේ ආරම්භක අවස්ථාවයි. මේ අනුව රූපවාහිනිය ඉවත්වී අතුරු අරමුණ වූ අන්තර්ජාලය ප්‍රබල වී ඇත. ගෝර්ගේ Network (ජාලමය) සේවය එද ඇමරිකාවට මහත් පිටුවහලක් විය.

නමුදු එම ජාලයම අද වෙබ් අඩවි සඳහා භාවිතා වේ. මුලදී රූපවාහිනිය මගින් විසුරුවා හල ප්‍රවෘත්ති Google වැනි වෙබ් අඩවි මගින් ක්ෂණිකව විසුරුවා හරිනු ලැබීය. මිලියන 20 ක් පමණ ඇමෙරිකානු තරුණන්නන් අන්තර්ජාලය භාවිතා කරයි. ප්‍රවෘත්ති නැරඹීම හා රූපවාහිනියෙන් ඈත්වීමේ පුදුමය ඇමෙරිකාව තුළ පමණක් නොව ලොව පුරාම ඇතිවන උන්මාදයකි. CNN පවා වෙබ් අඩවි නැරඹීම සඳහා ප්‍රමුඛත්වය දී ඇති මුත් මේ තත්ත්වය වුවද නවත් නොබෝ දිනකින් වෙනස් විය හැකිය. මන්ද තාක්ෂණයේ අපූරු හාස්කම නම් උදවන හෙටට නැවුම් යමක් දයාද කිරීම වන නිසාවෙනි. ❑

**ඉංදික විජේසිංහ**